# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

## නීතිවේදී ගෞරව උපාධිය, පළමු වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය - අවසාන පරීක්ෂණය – 2023

## LAW12301– අපරාධ නීතිය

(පැය 2 විනාඩි 15)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව:04

**ප්‍රශ්න දෙකකට (02) පමණක්** පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)

---

01. '*actus non facit reum nisi mens sit rea*' යන මතාව තහවුරු කර ඇති ආප්තය (maxim) ප්‍රකාරව චූදිතයාගේ පාර්ශවයෙන් මානසික අංගය (*mens rea*) පැවතීම අපරාධයක් සංස්ථාපනය වීමේදී සම්බන්ධ වේ. ඒ අනුව, අපරාධයක් වෙනස් මූලිකාංග දෙකකින් සමන්විතය: භෞතික අංගය නොහොත් සාපරාධී ක්‍රියාව සහ වරදකාරී අංගය (fault element) නොහොත් සාපරාධී මනස. එසේම, චූදිතයාට සාපරාධී වගකීම පැවරීම සඳහා සාපරාධී ක්‍රියාව සහ සාපරාධී මනස අතර හේතුඵල සම්බන්ධයක් ඇති කළ යුතුය.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුර දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු මගින් සනාථ කළ යුතුය.

(ලකුණු 30)

02. ශ්‍රී ලංකාවට සමාන නීති පද්ධතියක් ඇති රාජ්‍යයක් වන ෂාරිලන්ඩ්, විලවුන් නිෂ්පාදන (cosmetic products) නිෂ්පාදනය කිරීම, ආනයනය සහ පරිභෝජනය නියාමනය කිරීමේ අරමුණින් 2023 අංක 14 දරන විලවුන් හා රූපලාවන්‍ය නිෂ්පාදන පනත මෑතකදී පනවන ලදී. මෙම පනත මගින් මධ්‍යම විලවුන්

නියාමන අධිකාරිය (CCRA) පිහිටුවන ලද අතර, එමගින් පුද්ගලයින් මෙන්ම පරිශ්‍රයන් පරීක්ෂා කිරීමට මෙම අධිකාරියට බලය ලබා දී ඇත. තවද, පනතේ 3 වැනි වගන්තිය පහත කරුණු සඳහන් කරයි: "මිලියන එකකට (PPM) එක් කොටසකට වඩා වැඩි රසදිය සාන්ද්‍රණයක් අඩංගු ඕනෑම සුදු පැහැගන්වන ආලේප (whitening cream) ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, සන්තකයේ තබා ගැනීම, විකිණීම සහ ප්‍රවර්ධනය කිරීම වරදක් වන අතර උපරිම මාස හයක කාලයක් සඳහා වන බරපතල වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙලක්ෂයක දඩයකට හෝ එම දෙයාකාරයෙන්ම දඬුවම් කළ හැකිය.

ටීනාස් බියුටි සීක්‍රට්ස්හි හිමිකාරිය වන ටීනා, නිවසේ සාදන සුදු පැහැගන්වන රාත්‍රී ආලේපන (whitening night cream) නිෂ්පාදනය සඳහා අසල්වැසි රටකින් අමුද්‍රව්‍ය ආනයනය කරන අතර, එම අමුද්‍රව්‍යවල රසදිය සාන්ද්‍රණය PPM තුනකට වඩා වැඩි වේ. ටීනාස් බියුටි සීක්‍රට්ස්හි නියෝජිතයකු වන අනිල්, සිල්ලර වෙළඳාම සඳහා ටීනාගේ සුදු පැහැගන්වන රාත්‍රී ආලේපන පැකට්ටු පනහක් ගබඩා කර තිබුණි. අනිල්ගේ වෙළෙඳසලේ නිත්‍ය පාරිභෝගිකයෙකු වන කමලා විලවුන් නිෂ්පාදන (cosmetic items) මිලදී ගැනීමට පැමිණියාය. අනිල්ගේ නිර්දේශයෙන් බලපෑමට ලක්ව, කමලා ටීනාගේ සුදු පැහැගන්වන රාත්‍රී ආලේපන පැකට්ටු දෙකක් මිලදී ගත්තාය. මේ අතර, ඇතැම් පැමිණිලිවලට ප්‍රතිචාර දක්වමින්, CCRA නිලධාරීන් අනිල්ගේ වෙළඳසැලට ඇතුළු වූ අතර, එම පරිශ්‍රයේ තිබී ටීනාගේ සුදු පැහැගන්වන රාත්‍රී ආලේපන පැකට්ටු කිහිපයක් සොයා ගන්නා ලදී. කමලාගේ අත්බෑගය පරීක්ෂා කිරීමේදී එම විලවුන් නිෂ්පාදන පැකට්ටු දෙකක් ද නිලධාරීන්ට හමුවී ඇත. විලවුන් හා රූපලාවන්‍ය නිෂ්පාදන නියාමනය කිරීමේ පනතේ විධිවිධාන යටතේ ටීනා, අනිල් සහ කමලාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට CCRA අදහස් කරයි.

සම්බන්ධිත පාර්ශවයන්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 30)

03. (අ) සහ (ආ) යන කොටස් **<u>දෙකටම</u>** පිළිතුරු සපයන්න

(අ) ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය තුළ දඬුවම් කිරීමේ මූලික අරමුණු විස්තර කර එකී අරමුණු ශ්‍රී ලංකාවේ පිළිගත් නිවැරදි කිරීමේ ක්‍රමවේද (correctional methods) මගින් ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි ගවේෂණය කරන්න.

අදාළ දඬුවම් සහ දණ්ඩන න්‍යායන් ඇසුරින් ඔබේ පිළිතුරට සහාය දක්වන්න.

(ලකුණු 15)

(ආ) "සෑම තැත්කිරීමක්ම සාර්ථකත්වයට පත් නොවූවද, එය එනයින්ම හානියක් වන බැවින් සහ එය සාර්ථක වූ අවස්ථාවක දී මෙන්ම වරදකරුගේ සදාචාරාත්මක වරද සමාන වන හෙයින් අනතුරු ඇඟවීමක් සිදු කළ යුතු නිසා, තැත්කිරීමක් දඬුවම් ලැබිය හැකි බවට පත්කර ඇත... ක්‍රියාව සිදු කළ අවස්ථාවකදී තරම් හානිය විශාල නොවන හෙයින් දඬුවමෙන් අඩක් පමණක් ලබා දෙනු ලැබේ". – Arijit Pasayat, J. in ***Aman Kumar and Another v. State of Haryana*** (2004) 4 SCC 379.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද? ශ්‍රී ලංකාවේ අදාළ නීති අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුරට සහාය දක්වන්න.

(ලකුණු 15)

**(ලකුණු 15x2= ලකුණු 30)**

04. ඩේවිඩ් වෙලින්ටන්ගේ, ඔහුගේ බිරිඳ සහ පුතුන් දෙදෙනාගේ පිළිස්සී ගිය සිරුරු සම්පූර්ණයෙන් පිළිස්සී ගිය ඔවුන්ගේ නිවසේ තිබී සොයාගෙන ඇත. ජේම්ස් ටයින්, ඔහුගේ බිරිඳ මේරි සහ ඔවුන්ගේ පුතුන් පස්දෙනා මෙම අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත. දේපල ආරවුලක් සම්බන්ධයෙන් වෙලින්ටන් සහ ටයින් පවුල් අවස්ථා කිහිපයකදීම බහින් බස්වීම් සහ එකිනෙකාට තර්ජන කරන අයුරු දැකගන්නට ලැබී ඇත. ජේම්ස් ටයින් සහ ඔහුගේ බිරිඳ, වෙලින්ටන් පවුල මරා දමා ඔවුන්ගේ නිවස ගිනි තැබීම සඳහා

බලපත්‍ර රහිත තුවක්කුවක් ලබාගෙන පෙට්‍රල් කෑන් කිහිපයක් ගබඩා කර තිබුණි. ජේම්ස් හෝ මේරි ඔවුන්ගේ සැලසුම් ඔවුන්ගේ පුතුන් පස් දෙනාට පවසා නැති නමුත් ඔවුන්ගේ දෙමාපියන් නොදැන පුතුන් පස්දෙනා විසින් ටයින් පවුලේ පුතුන් දෙදෙනාට පහර දීමට සැලසුම් කර ඇත. අපරාධය සිදු වූ දින රාත්‍රියේ පවුල් දෙකේ පුතුන් අතර ගැටුමක් ඇති වූ අතර දෙමාපියන් ද ඊට සම්බන්ධ විය. ඩේවිඩ් තම පුතුන්ට උදව් කිරීමට කඩිනමින් පැමිණි අවස්ථාවේදී, ජේම්ස් ඔහුගේ තුවක්කුව රැගෙන එම ස්ථානයට පැමිණියේ ය. ජේම්ස්ගේ එක් පුතෙකු විසින් තම පියාගේ තුවක්කුව උදුරාගෙන ඩේවිඩ්ව මාරාන්තික ලෙස තුවාල වන ආකාරයෙන් වෙඩි කිහිපයක් එල්ල කළේය. ඩේවිඩ්ගේ පවුලේ අය ඔවුන්ගේ නිවස වෙත පසුබසින ලදි. මේරි ඇගේ අදහස වෙනස් කරගෙන තිබූ බැවින් ඔවුන්ව මරා නොදමන ලෙස සිය සැමියා වන ජේම්ස්ට ආයාචනා කළ ද, ඔහු ඔවුන්ගේ පුතුන් පස්දෙනාගේ දැනීමෙන් තොරව තමාගේ පෙට්‍රල් තොගය භාවිතා කරමින්ඩේවිඩ්ගේ නිවසට ගිනි තැබුවේය.

ඔබ ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුවේ අභිචෝදක කණ්ඩායමේ නීතිඥයෙක් යැයි උපකල්පනය කරන්න. සහභාගීවන ආකාරයන්ට (modes of participation) **පමණක්** සීමා වෙමින් පොදු චේතනාව, එකම චේතනාව, කුමන්ත්‍රණය හෝ තැත්කිරීම සම්බන්ධයෙන් වන දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති සහ නඩු තීන්දු නීතිය පිළිබඳව සාකච්ඡා කරමින්, ටයින් පවුලේ සාමාජිකයන් හත්දෙනාට සාපරාධී වගකීම පැවරීමට ඔබ ගන්නා ප්‍රවේශය පැහැදිලි කරන්න.

(ලකුණු 30)

***